# මිරිඟුවෙන් එහා නොගිය මිරිඟුවෙන් එහා




ජගත් ජේ එදිරිසිංහ




විනීතා විජේරත්නගේ නවතම නවකතාව

නවකතාවක් ලිවීම යනු සත්‍ය නොවන සිදුවීම් වැළක් එකට ගැට ගසා කිසියම් සත්‍යයක් නිර්මාණය කිරීම යයි ඇෆ්ඝනිස්ථානයේ ඉපිද ඇමරිකාවේ ජීවත් වන නවකතාකරුවකු වන ඛාලිඩ් හොසෙයිනි (Khaled Hosseini) වරක් ප්‍රකාශ කළේය. කයිට් රනර්, තවුසන්ඩ් ස්ප්ලෙන්ඩිඩ් සන්ස් වැනි නවකතා ලිව්වේ ඔහුය. ඛාලිඩ් ගේ මේ ප්‍රකාශය විනීතා විජේරත්න ලේඛිකාවගේ මිරිඟුවෙන් එහා නම් වන නවකතාව පිළිබඳ මගේ අදහස් ලිවීමේදී වැදගත් වේ යයි සිතමි.

මිරිඟුවෙන් එහා විනීතා විජේරත්න ලේඛිකාවගේ හතරවන නවකතාවයි. ඇය මෙයට පෙර නාමල් අරණ ගිනි අවියයි රෝස මලයි සහ හිරු නොදැක පිපෙන මල් නමින් නවකතා තුනක් ප්‍රකාශයට පත් කර ඇත.

මිරිඟුවෙන් එහා නවකතාවට පාදක වන්නේ අනුරාධපුරයේ ඉපිද ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ සෑම් ගේත් තවමත් අනුරාධපුරයේ ජීවත් වන ඔහුගේ දෙමාපියන් වන රොමියෙල් හාමිත් යසෝහාමිනේත් ඇතුළු පවුලේත් කතාවයි. සෑම් සිය දෙමාපියන් අමතතක කර ඕස්ට්‍රේලියාවේ ගෙවන අතෘප්තිකර දිවියත් ඔහුගේ අනුරාධපුරයේ දෙමාපියන් අඩු ලුහුඬුකම් මැද වුවත් ගෙව තෘප්තිමත් ජීවිතයක් අතර කතාව පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට දෝලනය වෙයි.

රොමියෙල්හාමි අනුරාධපුරයේ පණ්ඩුල ගමට පදිංචියට පැමිණෙන්නේ ඔවුන් කලින් විසූ මැදවච්චියේ යකා වැවට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ලවීමෙන් පසුවය. පණ්ඩුල ගමදී ඔවුහු ක්‍රමයෙන් දියුණුවක් ලබා ගනිති. මේ දියුණුව ආර්ථික සේම අධ්‍යාත්මික දියුණුවක් බව කතුවරිය වරින් වර අපට පෙන්වා දෙයි. අනෙක් අතින් සිය බිරිඳ මාලතී සමගින් ඕස්ට්‍රේලියාවේ ජීවත්වන සමරපාල - සෑම් - සිය පවුලේ සංකර දිවි පෙවෙත හමුවේ දැඩි මානසික පිඩනයක් සිත දරා ජීවත්වෙයි. ඔහුගේ දරුවන් අයාලේ යද්දී තමන් මේ ලබාගත් ආර්ථික දියුනුව සැබෑ දියුණුවක්ද යන පැනය ඔහුගේ සිතට වද දෙයි. දෙමාපියන් අමතක කර දිවි ගෙවන ඔහු සිය සහෝදරිය එවන ලිපි වලට පවා පිලිතුරු යැවීම අතපසු කරයි. ඔහු අවසන අනුරාධපුරයට එන්නේ සිය පියාගේ මලගමටය.

මේ කතාව ගෙතීමේදී ලේඛිකාව ඔස්ට්‍රේලියාවේ අත්දැකීම් මැනැවින් යොදා ගනියි. සුද්දන්ගේ දිව උළුක් වේ යයි උපන් අනුකම්පාවෙන් නම් වෙනස් කර ගනිමින් "සෑම්" ලා වූ සමරපාලලා ඔස්ට්‍රේලියාවේ දී ලේඛිකාවට අනන්තවත් හමුවන්නට ඇත. ශ්‍රී ලංකාවේ ජීවත්වන තම දුප්පත් දෙමාපියන් නොතකා ජීවත් වන ආත්මාර්ථකාමී මිනිසුන් පිළිබඳ බොහෝ කතා ද ඇගේ අත්දැකීම් ගොන්න අතර තිබෙන බවට සැක නැත. ඒ අත්දැකීම් ඈ වචන බවට පෙරළන්නේ මෙසේය

***සෑම් තම සිතට එබී බැලුවේය. තම අතීතය දැන් දැන් ඔහුගේ චිත්ත සන්තානයේ හොල්මන් කරයි. පසුගිය අවුරුදු කපය තුළ ලියුම් දෙක තුනක් තම ගෙදරට තැපැල් කළත් පිලිතුරු නොලැබුණ කල වැඩ රාජකාරි හමුවේ ගම් පළාත කෙමෙන් මතකයෙන් ඈත් වූ අයුරු ඔහුගේ සිත පාරයි. - මිරිඟුවෙන් එහා 156 පිට***

ඒ සෑම්ලාගේ දරුවන් තරුණ වියට එළැඹ දෙමාපියන් අතහැර ඉගිල යනුද ලේඛිකාවෙ නිරීක්ෂණය කරන්නට ඇත. ඇගේ නවකතාවේ චරිත මත ආරෝපනය වන්නේ ඒ අත්දැකීම් ය. ඒවා සත්‍ය නොවන සිදුවීම් නොවේ. ඇය මේ ගැට ගසන්නේ සත්‍යයයි. මේ සත්‍යයට මෙලෙසින් පවතින්නට හේතුකාරක වන විවිධාකාර සමාජයීය සහ මානුෂික සාධක පිලිබඳවද කතුවරිය වරින් වර පාඨක අවධානය යොමු කරයි. එය සාර්ථක උත්සාහයකි.

සෑම්ගේ නැගණිය වන අනුරාධපුරයේ පන්ඩුල ගම දුප්පත් ලෙස ජීවත්වන තිලකලතා ගේ සැමියා වන ගුණපාල ඉසුරුමුණිය පන්සල අසළ බඩඉරිඟු තම්බා වන්දනාකරුවනට විකුණන්නේ දිවි ගැට ගසා ගන්නටය. ඔවුන්ගේත් ඔවුන්ගේ දෙමාපියන්ගේත් අත්දැකීම් කතුවරියට දුරස්ථ බවක් පොත කියවන විට අපට දැනෙයි. සිය බඩඉරිඟු වෙළඳාමෙන් මුදල් රැස් කර ගමේ වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන්නට ගුණපාලට හැකිවන අතර ඔහු සිය බිරිඳත් සමගින් සාර්ථක පවුල් ජීවිතයක් ගෙනයන්නේ ඇගේ දෙමාපියන්ටද නිසි ලෙස සළකමින්ය.

සිය නවකතාව නිර්මාණයේදී විනීතා භාවිතා කරන භාෂාව සරළ නමුත් නිවැරදිය. මෙයට පෙර නවකතා තුනක් ලිවීමෙන් ඇය ලද පන්නරය මේ යහපත් භාෂා භාවිතයට රුකුලක් වන්නට ඇත. කීප පොළක ඇති වියරණ වැරදි පිලිබඳ ඇය වඩාත් සැළකිලිමත් වූවා නම් වඩා යහපත්ය.

විනීතාගේ නවකතා වල අප දකින බුද්ධධර්මය පිලිබඳ දීර්ඝ සංවාද හා අදහස් මිරිඟුවෙන් එහා නවකතාවේදීද අපට හමුවෙයි. කතුවරියගේ අරමුණ මිනිසුන් මුහුණ දෙන දුක්ඛ දෝමනස් සයනට විසඳුම ඇත්තේ බුදු දහම වෙත සමීප වීම තුළය යන්න කියා දීම විය යුතුය.

***තෘෂ්ණාව නිසා ශෝකය උපදිනවා. තෘෂ්ණාව නිසා භය උපදිනවා. මේ මහා තෘස්ණාව විනාශ කිරීමෙන් මේ දුක් දෙන මහා විපත් වලින් මිදිල සංසාර ගමන වළක්ව ගන්න පුලුවන්.***

***මාලතීගේ සිතට කිසිම දිනෙක නොලැබූ ප්‍රීතියක් උපදී. ඇය සමරපාල දෙස බැලුවාය. ඔහුගේ දෙනෙත් මහ සෑ රජු දෙසට යොමු වී පවතී. ඒ දෑසේද මහත් පහන් බවක් ඇත . බුද්ධාලම්භණ ප්‍රීතියෙන් ඇගේ සිත පිරී යයි.***

***සද්ධර්ම රත්නයේ සිසිලස ඇගේ සිත තවත් පහන් කරවයි***

***මිරිඟුවෙන් එහා 213 පිට***

සිය ඉලක්ක අරමුණ කරා විනීතා සිය පාඨකයන් රැගෙන යන්නේ එසේය.

"සමාජ ශෝධනය නිර්මාණකරුවාට අයත් රාජකාරියක් නොවේ" යයි ප්‍රවීණ කිවියර රත්න ශ්‍රී විජේසිංහ ශූරීන් පසුගියදා මෙල්බන් නුවර ලක්මැදුරේදී කළ සංවාදයේදී දැක් වූ අදහස මගේ සිතට එයි.

අත්දැකීම් සහ පරිකල්පනය නිසි ලෙස තෝරා බේරා ගනිමින් නවකතාවක් ලිවීමේ අපහසු කාර්යය විනීතා සාර්ථකව ජය ගෙන ඇත. ඒ බව මහාචාර්ය දයා රෝහණ අතුකෝරාල මහතා ලියා ඇති පසු වදනින්ද පැහැදිළි වෙයි.

සිය උපන් මව් බිම අමතක කර ආත්මාර්ථකාමී දිවි ගෙවන සෑම් බඳු මිනිසුන් විනීතා කියා දෙන පාඩම තේරුම් ගනියිද යන ප්‍රශ්නය පොත කියවා හමාර කරන මොහොතේ මගේ සිතේ නැගුණි. කතාකරුවාගේ රාජකාරිය සමාජය හැදීම නොවන හෙයින් ඒ ප්‍රශ්නය සාධාරණ නැත




**Tutoring**

**22 years of experience in tutoring in Melbourne with Proven Results.......!**

*Coaching for*
- Mathematics for Primary and Secondary
- VCE Mathematics: *Mathematical Methods, General Mathematics, Further Mathematics, Specialist Mathematics*
- VCE Physics
- English from Primary to year 9
- Science for Secondary
- Scholarship and Selective School exams
*Melbourne High, Mac.Robertson, Suzanne Cory, Uni High, John Monash, Ivanhoe Grammar, Trinity Grammar, Melbourne Grammar, PEGS, etc.*

**Small groups - up to 4 students.....!**
**Individual classes on request**

**Neranjana Kudaligama**
**0408 356 821**
Masters in Accounting (La Trobe)
B. Applied Science (Computer Science and Software Engineering) (Swinburne)
Civil Eng. (Moratuwa)
Ex. Teacher, VSL - Roxburgh Park Sinhala School

**Hemantha Devendra**
**0409 854 597**
VIT Registered Teacher
Post Grad. Dip Edu.(La Trobe)
B. Design (Industrial Design) (RMIT)
Mech Eng (Moratuwa)